UNITED NATIONS
SRI LANKA

# 2024 වාර්ෂික ප්‍රතිඵල වාර්තාව

දේශපාලනමය සංක්‍රාන්තිය, ආර්ථික ප්‍රතිසාධනය අඛණ්ඩව පවත්වාගෙන යාම, සහ තිරසර සංවර්ධනය කරා සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළ 2024 වර්ෂය ශ්‍රී ලංකාවට තීරණාත්මක වූ වර්ෂයක් ලෙස සනිටුහන් විය.

ජාතික ප්‍රමුඛතා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ප්‍රතිඵල ලබාගැනීම පිණිස රජය සහ දේශීය හවුල්කරුවන් සමග සහයෝගිතාව ඇතිව කටයුතු කිරීමට එක්සත් ජාතීන්ගේ ආයතන 21 එකට එක් වූ අතර, එම කාර්යයන්ට මගපෙන්වනු ලැබුවේ 2023-2027 එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන සහයෝගීතා රාමුවයි.

## 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්

### සමාජ ආරක්ෂණය සහ අත්‍යවශ්‍ය සේවාවන් පුළුල් කරන ලදී

- පෝෂණීය වශයෙන් අනතුරාසන්නව සිටි මිලියන 2.5 ක ට ආසන්න ජනතාවක් වෙත ආහාර සහ පෝෂණ අතිරේක සපයන ලදී.
- පාසල් ළමුන් වෙත දෛනික පෝෂණීය පාසල් ආහාරවේල් 230,000ක් පිළිගන්වනු ලැබීය.
- 9,000 ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් ප්‍රචණ්ඩත්වයේ බලපෑමට ලක් වූ අය වෙත සහය ලැබිණ.
- 240,000 ජනතාවකට, සුරක්ෂිත ජලය සහ සනීපාරක්ෂණය වෙත ප්‍රවේශය හිමි විය.
- (ජලය, සනීපාරක්ෂාව, සහ ස්වස්ථතාව) පහසුකම් සහ සුපිරිසිදු බලශක්තිය සමගින් සෞඛ්‍ය සේවා පහසුකම් 1,000 ක තත්ත්වය ඉහළ නැංවිණ.

### ජීවනෝපායයන් සහ ඇතුළත් භාවයෙන් යුතු ආර්ථික වර්ධනය ඉහළ නංවන ලදී

- 3318,000 ජනතාවකට, වෘත්තීය පුහුණු වලින් ප්‍රතිලාභ සැලසිණ.
- 34,000 පුහුණු සේවකයින් හට වැඩිදුර පුහුණුව ලබා දුණි.
- 338 ක්ෂුද්‍ර-, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත, සේවාස්ථාන ආරක්ෂණයේ වැඩිදියුණුව උදෙසා සහය දුණි.

### දේශගුණික ක්‍රියාමාර්ග සහ පාරිසරික තිරසර භාවය පිළිබඳ කටයුතු ඉහළ නංවන ලදී

- 840,000 ජනතාවකට, දේශගුණික-සුහුරු පිළිවෙත් යොදා ගැනීමේ හැකියාව උදා කෙරිණ.
- ගොවි/ධීවර ප්‍රජාවන් අතරින් 21,000 ජනතාවක් තිරසර පිළිවෙත් පිළිබඳ පුහුණුව ලැබීය.
- සූර්ය සහ සුනිත්‍ය බලශක්ති සවි කිරීම් 262 සිදු කෙරිණ.

## රාජ්‍ය-පාලනය, යුක්තිය සහ නීතියේ ආධිපත්‍යය සවිමත් කරන ලදී

- 160,000 ජනතාවකට, අධිකරණ පද්ධතිය වෙත වඩා හොඳ ප්‍රවේශයක් හිමි විය.
- 700 රාජ්‍ය නිලධාරීන් පිරිසකට, මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීමේ පුහුණුව ලැබිණ.
- 25,000 ජනතාවකට, දූෂණ විරෝධී පියවර පිළිබඳ වැඩිදියුණු වූ දැනුවත් භාවය හිමි විය.

## සමාජ ඒකාබද්ධතාව සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කරන ලදී

- පවුල් 450ක් නැවත පදිංචි කරන ලද අතර, නැවත පැමිණි 1,000 ට වැඩි පිරිසක් වෙත ලේඛන ලබාදීම සිදු කෙරිණ.
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සෞඛ්‍යය, සහ සාමය-ගොඩනැගීම පිළිබඳ වැඩසටහන් ලබාදීම පිණිස සිවිල් සමාජ වෙත සහය ලබා දුණි.
- වෛරී කථනය සහ සාවද්‍ය තොරතුරු වලට එරෙහි වීම පිණිස මාධ්‍ය ස්ථාන 17ක් සහ සිවිල් සමාජ සංවිධාන 23ක් වෙත අවශ්‍ය දෑ සලසා දුණි.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් බලගැන්වීම වැඩිදියුණු කරන ලදී

- 600 කාන්තා නායක පිරිසක්, ගැටුම් කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණු කෙරිණ.
- ආබාධ සහිත කාන්තාවන්, ළමුන් සහ පුද්ගලයින් 11,000 සඳහා යුක්තිය වෙත වැඩිදියුණු කළ ප්‍රවේශය සලසා දුණි.
- පොලිස් ස්ථාන 7 ක, වින්දිත-මුහුණ පෑ අය සඳහා සහය සලසන හදිසි අංශ ස්ථාපිත කෙරිණ.

## මූල්‍ය සහය සැපයීම සහ ලබාදීම්

83%ක ලබාදීම් අනුපාතිකයක් සහිතව එක්සත් ජාතීන් විසින් ඩොලර් මිලියන 79.9ක් ආයෝජනය කර ඇත. වැඩසටහන් සම්පාදනයෙන් 12% හවුල්කාරිත්වයෙන් යුතු වූයේ සංවර්ධනය වෙත දක්වන විවිධ පැතිකඩ එකට එක් කළ (සමෝධානික) ප්‍රවේශයන් පෙන්නුම් කරමිනි.

එක්සත් ජාතීන්ගේ වැඩපිළිවෙළ වලින් 71% ක අවධානය යොමු කෙරුණේ, පද්ධති වල දිගු-කාලීන සවිමත් භාවය සහ ජාතික හිමිකාරිත්වය ප්‍රවර්ධනය කෙරෙන ධාරිතා සංවර්ධනය සහ තාක්ෂණික සහය වෙත ය.

වෛරී කථනය, ඩිජිටල් පරිණාමනය, සහ සමාජ ඒකාබද්ධතාව පිළිබඳ වැඩපිළිවෙළ ඇතුළුව, 2024 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සියලුම හවුල් ආයෝජන වලින් 75%ක් වෙත සහය සලසන ලද්දේ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක අරමුදල වෙතිනි.

# 2025 වර්ෂය සඳහා ප්‍රමුඛතා

## ආර්ථික වර්ධනය වේගවත් කිරීම

ක්ෂුද්‍ර-, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ හරිත මූල්‍යකරණය වෙත සහය සලසමින්, ඵලදායීතාව, අපනයන, සහ ඩිජිටල්කරණය ඉහළ නැංවීම.

## දරිද්‍රතාව පිටුදැකීමට තිසි පියවර ගැනීම

සමාජ ආරක්ෂණය පුළුල් කරමින්, ග්‍රාමීය ජීවනෝපායයන් වැඩිදියුණු කරමින්, සහ මූලික සේවාවන් වෙත සාධාරණ ප්‍ර වේශය සහතික කරමින් දරිද්‍රතාව පිටුදැකීමට තිසි පියවර ගැනීම.

## ඩිජිටල් පරිණාමනයට සහය දීම

සිවිල් ලියාපදිංචි කිරීම් පද්ධතිය වෙත ලියාපදිංචි කිරීමේ තනි ක්‍රමවේදයක්  ක්‍රමයෙන් හඳුන්වාදීම ද ඇතුළුව, ඩිජිටල් යටිතල පහසුකම් සහ රාජ්‍ය සේවාවන් සවිමත් කිරීම.

## තිරසර භාවය, ඇතුළත් භාවය, සහ සමාජ ඒකාබද්ධතාව වැඩිදියුණු කිරීම

ඓතිහාසික වශයෙන් අඩු-වරප්‍රසාද සහිත කලාපයන් වෙත විශේෂ අවධානය යොමු කරමින් සාමය, මානව හිමිකම්, සහ දේශගුණිකව ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම.

© United Nations in Sri Lanka

United Nations | Office of the UN Resident Coordinator
202-204, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka
+94 (11) 2583805
rcs-srilanka@un.org | srilanka.un.org

වාර්තාව බා ගත කරගන්න